# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2007/24 - 2017 පෙබරවාරි මස 21 වැනි අඟහරුවාදා - 2017.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

5 වන වගන්තිය යටතේ නියෝගය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ 2016 ජනවාරි මස 01 වැනි දින අංක 1947/46 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් අවසන් වරට සංශෝධිත 2006 ඔක්තෝබර් මස 05 වැනි දින අංක 1465/20 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය 2017.02.21 දින සිට බලපැවැත්වෙන පරිදි පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2017 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

එම උපලේඛනයේ 12, 15 හා 16 වැනි අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පිළිවෙලින් පහත සඳහන් අයිතමයන් ආදේශ කිරීමෙන් ;

"12. (*අ*) යම් ජීවිත හෝ වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් ; හෝ

(*ආ*) (i) සිවිල් ඉදිකිරීම් කර්මාන්තයේ දී හෝ කෘෂිකර්මාන්තයේ දී යොදාගන්නා පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ; හෝ

(ii) 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 122 වන වගන්තියේ අර්ථය තුළ මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම අනුව, බී පන්තියට අයත් යම් මෝටර් රථයක් හෝ ද්විත්වකාර්ය වාහනයක් හැර අනෙකුත් මෝටර් වාහන ; හෝ

සම්බන්ධයෙන් වන යම් රක්ෂණ ඔප්පුවක් ;

15. 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 122 වන වගන්තියේ අර්ථය තුළ මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම අනුව, බී පන්තියට අයත් යම් මෝටර් රථයක් හෝ ද්විත්වකාර්ය වාහනයක් සම්බන්ධයෙන් වන යම් මූල්‍ය කල්බදු ගිවිසුමක් හැර, යම් දේපළක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද යම් මූල්‍ය කල්බදු ගිවිසුමක්

16. 2009 අංක 8 දරන මෝටර් වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 122 වන වගන්තියේ අර්ථය තුළ මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම අනුව, බී පන්තියට අයත් යම් මෝටර් රථයක් හෝ ද්විත්වකාර්ය වාහනයක් හැර යම් චංචල දේපළක් සම්බන්ධයෙන් 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ ඇතිකර ගත් යම් කුලී සින්නක්කර ගිවිසුමක්"

03 - 307


1A - G 25182 — 57 (2017/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*